**දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ සංරචකය - 1 - 2015**

**-----------------------------------------------------------------------------------------**

දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ සංරචකය - 1 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 අගෝස්තු 19 දින එලඹී අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------------------------------------**

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය, වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර පළාත් මට්ටමින් ව්‍යාපෘතියේ කාර්යයන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සැපයීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා වඩා යහපත් ප්‍රතිචාර ඇති කිරීම සඳහා හැකිවනු පිණිස මහජන සෞඛ්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රමිතීන් ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,270 කට සමාන විගැහි (SDR) මිලියන 129.8 ක් (එජඩො මිලියන 200 ක්) වන අතර ඉන් රු.මිලියන 24,006 කට සමාන විගැහි (SDR) මිලියන 123.31 ක් (එජඩො මිලියන 190 ක්) ව්‍යාපෘතියේ සංරචකය - 1 යටතේ සිදු කළ යුතු කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘති කාර්යයන් 2013 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. මෙම වාර්තාව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් සිදු කරන ලද කාර්යයන් හා වෙනම ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතියේ සංරචකය - 1 සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් වලින් සමන්විත වේ.

## 1.3 මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම්වල සංස්කරණයක් වන මෙම මූල්‍ය වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය වාර්තාවේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය

කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාවේ දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ සෞඛ්‍ය අංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) මූල්‍ය වාර්තාව මුදල් රෙගුලාසි 150 සහ මහා භාණ්ඩාගාරයේ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/ 2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද 2015 වර්ෂය සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම් පදනම් වූ මූල්‍ය වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/ 2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි. ඉහත සඳහන් විසර්ජන ගිණුම, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය

ඇස්තමේන්තු, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පවත්වා ගනු ලබන පොත්පත්, ලේඛන සහ වාර්තා සමඟ එකඟවන බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-----------------------------------------

2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.
-----------------------------------------------------

පූර්ණ කාලීන පදනම මත නිලධාරීන් බඳවා ගැනීම පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2014 මැයි 21 දිනැති අංක ඩීඑම්එස්/සී/1/16 ව්‍යා. දරන ලිපිය මඟින් කර ඇති නියෝගවලට පටහැනිව, රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත ව්‍යාපෘති අධ්‍යක්ෂ, ගණකාධිකාරී හා ව්‍යාපෘති නිලධාරීන් ඇතුලු ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්ය මණ්ඩලය වැඩබැලීමේ පදනම මත ව්‍යාපෘතිය විසින් යොදවා ගෙන තිබුණි.

2.2.2 මූල්‍ය සම්මුතීන්වලට අනුකූල නොවීම
-----------------------------------------------

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව, පාරිසරික තක්සේරුවක් සිදු කළ යුතු අතර 2015 පෙබරවාරි 28 දින ආරම්භ වී ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසන් වන දිනය දක්වා එක් එක් වර්ෂයේදී පාරිසරික කළමනාකරණ රාමුව පිළිබඳ කාර්යසාධනය තක්සේරු කර වාර්තාවක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද මෙම අවශ්‍යතාවය සඳහා ව්‍යාපෘතිය අනුකූල වී නොතිබුණු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා තක්සේරු වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය
----------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
----------------------------

ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙනයනු ලබන වාර්තා අනුව, අරමුදල් මූල්‍යයනය, අයවැයගත වෙන්කිරීම හා සමාලෝචිත වර්ෂය සඳහා සහ 2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං සංරචකය - I | 190 | 24,006 | 2,670 | 14.40 | 1,848 | 28.18 | 3,618 |
| එකතුව | 190 | 24,006 | 2,670 | 14.40 | 1,848 | 28.18 | 3,618 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල අනුව, රු.මිලියන 5,617 කට සමාන එජඩො මිලියන 43.75 ක් සමාලෝචිත වර්ෂය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් වියපැහැදම් කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ රු.මිලියන 2,670 ක මුදලක් පමණක් වෙන්කර තිබුණි. ඉහත වෙන්කිරීමෙන්, සියයට 69 ක් නියෝජනය වන රු.මිලියන 1,848 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණි.

(ආ) ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතිය යටතේ සලසන ලද රු.මිලියන 24,006 කට සමාන එජඩො මිලියන 190 ක් වූ මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 3,618 කට සමාන එජඩො මිලියන 28.18 ක මුදලක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබූ අතර එය මුළු වෙන්කිරීමෙන් සියයට 14.8 කින් නියෝජනය විය. එබැවින් ව්‍යාපෘතියේ ඉතිරි කාලපරිච්ඡේදය වන වර්ෂ 03 ක කාලය තුළ සම්පූර්ණ වෙන්කිරීම උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිතය.

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය යටතේ ඉටුකරගත යුතු භෞතික ඉලක්ක, වියපැහැදම් සම්බන්ධ වන දර්ශක (Disbursement Link Indicators) 03 ක් හා වියපැහැදම් සම්බන්ධ නොවන දර්ශක (Non - disbursement Link Indicators) 11 ක් මත පදනම් වේ. නියැදි පරීක්ෂණයකදී, වියපැහැදම් සම්බන්ධවන දර්ශක 03 ක් හා වියපැහැදම් සම්බන්ධ නොවන දර්ශක 11 න් දර්ශක 08 ක් අපේක්ෂිත ප්‍රතිඵල ඉටුකරගෙන තිබූ බව අනාවරණය විය. ඉතිරි වියපැහැදම් සම්බන්ධ නොවන දර්ශක 03 යටතේ දක්වා ඇති ඉලක්ක ඉටුකර ගැනීම පිළිබඳ මන්දගාමී ප්‍රගතිය සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

(අ) සෞඛ්‍ය අංශයේ පුහුණුකිරීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම් සඳහා වූ වියපැහැදම් සම්බන්ධ නොවන දර්ශක - 7 අනුව, දිවයිනේ ව්‍යාප්ත කර ඇති පුහුණු කිරීම් ආයතන 34 කින් පුහුණු කිරීම් ආයතන 07 ක් ජාතික ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි සමාලෝචිත වර්ෂය තුළ වැඩිදියුණු කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද වැඩිදියුණු කිරීම් පිළිබඳ ප්‍රමිතීන් සඳහා ළඟාවීමට පුහුණු ආයතන 05 කට හැකි වී තිබුණි.

(ආ) ව්‍යාපෘතියට සම්බන්ධ නොවන දර්ශක - 9 යටතේ සමාලෝචිත වර්ෂය තුළ අළුතින් ක්ෂයරෝග, රෝගීන් 13,577 ක් හඳුනා ගැනීමට අපේක්ෂා කර තිබුණද, රෝගීන් 9,246 ක් පමණක් හඳුනාගෙන තිබුණි. (විගණන මතයට අනුව, අළුත් ක්ෂය රෝගීන් හඳුනාගැනීම ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ රෝග හඳුනාගැනීම ගැන රෝගීන් දැනුවත්කිරීම හා අඛණ්ඩව ප්‍රතිකාර මගිනි.) එබැවින් දැනුවත් කිරීමේ වැඩසටහන් හා රෝග පිළිබඳ කලින් සොයාගැනීම සහ ඒ පිළිබඳ ප්‍රතිකාර සඳහා පහසුකම් වැඩිදියුණු කිරීමට වැඩි අවධානයක් යොමු කළ යුතුය.

(ඇ) ව්‍යාපෘතියට සම්බන්ධ නොවන දර්ශක - 11 ට අනුව, විෂයයන් 354 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා ප්‍රදානය කරන ලද මුළු කොන්ත්‍රාත් ප්‍රමාණයෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් 2015 වර්ෂයේ පළමු මාස 09 තුළ ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ප්‍රසම්පාදන විෂයයන් 167 ක් සඳහා කොන්ත්‍රාත් පමණක් එම කාලපරිච්ඡේදය තුළ ප්‍රදානය කර තිබුණි. ඉතිරි විෂයයන් 187 ප්‍රසම්පාදනය කිරීම සඳහා කොන්ත්‍රාත්තු සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේදී ප්‍රදානය කර තිබූ අතර එම කාලපරිච්ඡේදය තුළ සිදුකළ ප්‍රසම්පාදනයන් සඳහා ආර්ථික බව, කාර්යක්ෂමතාවය, ඵලදායී බව සහ විනිවිදභාවය ආදී කරුණු පිළිබඳ අඩු අවධානයක් යොමුකර තිබූ බව නිරීක්ෂණය විය.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

ලැබුණු තොරතුරු අනුව, යෝජනාවේ මූලාා සැලැස්මේ ඇතුළත් පිළිගත නොහැකි කොන්දේසි හේතුවෙන් ආසන්න වශයෙන් රු.මිලියන 6,853.46 කට සමාන එජඩො මිලියන 53.38 ක පිරිවැයකට ලීනියර් ඇක්සලරේටර්ස් (Linear Accelarators) 14 ක්, CT සිමියුලේටර් (Simulator) 08 ක් සහ බ්‍රැකිතෙරපි යන්ත්‍ර (Brachytheraphy Machines) 08 ක් යනාදී පිළිකා ප්‍රතිකාර උපකරණ සැපයීම සහ කොන්ක්‍රීට් බංකර ඉදිකිරීම ඇතුළත් එම උපකරණ සවිකිරීම සඳහා විදේශ සැපයුම්කරුවන් දෙදෙනෙකු විසින් 2010 සැප්තැම්බර් 09 දින කරන ලද කැමැත්තෙන් දුන් නොඉල්වූ යෝජනා ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද, 2015 අප්‍රේල් 30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එම උපකරණ ප්‍රසම්පාදනය සඳහා සහ එම කාර්යය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව යටතේ වෙන්කිරීම් උපයෝජනය කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. රෛඛීය අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තරව නව ලංසු කැඳවීමෙන් තොරව උපකරණ සවිකිරීම සඳහා පිරිවැයද ඇතුළත් එම මිලටම විදේශීය සැපයුම්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එබැවින්, ලීනියර් ඇක්සලරේටර්ස් (Linear Accelarators) 03 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 759.75 කට සමාන එජඩො මිලියන 6.23 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි.